# ඔබ නිශ්චල දේපළ වත්කම් උරුමව සිටිත්දී Centrelink දීමනා ලබයිද?



*Do you own real estate assets and receive a Centrelink payment?* — **Sinhalese**

යමකු ගේ නිවස Centrelink වත්කම් පරික්ෂණයට ඇතුලත් නොවේ. එසේ වුවද නිවස පිහිටා ඇති භූමිය හෙක්ටයාර දෙකකට වඩා වැඩි අවස්ථාවන්හිදී හෙක්ටයාර දෙකට වැඩි ප්‍රමාණය සැලකෙනුයේ වත්කමක් ලෙසය. එසේම ඕනෑම නිශ්චල දේපලක් උදාහරණ වශයෙන් නිවසක්, මහල් නිවාසයක්, හිස් ඉඩමක්, නිවාඩු නිකේතනයක්, ව්‍යාපාර කටයුත්තකට අදාල දේපලක් වත්කම්වලට ඇතුලත්වේ. එකී දේපළෙහි වෙළඳපල අගය මත වත්කම් පරීක්ෂණයට යටත් Centrelink ගෙවීම් කෙරෙහි බලපෑමක් ඇති කරණු ඇත.

## Centrelink ඔබේ වත්කම් පිළිබඳව දැන සිටින විට

ගතවූ අවුරුදු කිහිපය තුල බොහෝ ප්‍රදේශවල දේපල වටිනාකම ඉහල ගොස් ඇති බැවින් Centrelink හි ලිපිගොනු වල දැනට සඳහන් ඔබේ වත්කම්වල වටිනාකම මේ වන විට වැඩිවී තිබෙන්නට පුළුවන. ඔබට හිමි නිවැරදි දීමනාව සහතික කිරීම පහසු වීම පිණිස ඔබේ වත්කම් වල සිදුවී තිබෙන වෙනස් වීම් Centrelink වෙත දන්වන්න. ඔබේ දේපල තක්සේරුව සඳහා වෘත්තීමය තක්සේරුවක් වෙනුවෙන් විය පැහැදම් කිරීම අවශ්‍ය නැත. වෙළඳපලේ වටිනාකම පිළිබඳව ඔබට මනා අවබෝධයක් නැත්නම් Centrelink තක්සේරුවක් සඳහා කටයුතු සම්පාදනය කරන අතර ඔබේ ගෙවීම්ද නැවත තක්සේරු කරනු ලබනු ඇත.

Centrelink සිය පාරිභෝගිකයන් සතු දේපල වල වටිනාකම සංශෝධනය කිරීම සාමාන්‍ය දෙයකි. එයින් බලපෑමක් ඔබට ඇතිවේනම් ඒ පිළිබඳව දැනුම් දෙනු ඇත. වත්කම් වටිනාකම වැඩි කිරිමට ඔබ කටයුතු කර ඒ බව Centrelink වෙත දන්වා නොසිටියේ නම් හැර තක්සේරු සංශෝධනය කිරීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීමට ඔබට සිදු නොවනු ඇත. නිශ්චය කරන ලද වටිනාකම ඔබට පිලිගත නොහැකි නම් එය නැවත සලකා බලන ලෙසට ඉල්ලා සිටීමේ හැකියාවක් ඔබට ඇත.

ඔබ අවසන් වරට Centrelink ඇමතීමෙන් පසුව ඔබේ යම් දේපලකින් නිදහස් වී ඇති නම් ඒ පිළිබඳව Centrelink දැනුවත් කිරීම ඔබේ කැමැත්ත අනුව සිදුවිය යුතු වන්නේ එය ඔබේ ගෙවීම් කෙරෙහි බලපෑමක් ඇති කරන නිසාය. ඔබේ අයිතියේ ප්‍රතිශතය වෙනස්වේ හෝ ඔබේ වත්කම් මත පදනම්වූ උගස්කරයේ යම් වෙනසක් සිදුවේ නම්ද ඔබ Centrelink ඇමතිය යුතුය.

පෙර කී සකස් කිරීම් නිසා ඔබ දුෂ්කර ආර්ථික අපහසුතාවයන්ට පත්වේ නම් වත්කම් රෙගුලාසි ප්‍රකාර සලකා බැලීමක් කරන ලෙසට හෝ Pension Loan Scheme යටතේ ඔබට ණය මුදලක් ලබා ගැනීමට ඉල්ලුම් කල හැකිය.

## ඔබේ නියම වත්කම් පිළිබඳව Centrelink නොදන්නා විට

ඔබ සතුව ඇත්තවශයෙන්ම දේපල තිබියදී ඒ බව Centrelink වෙත දැනුම් නොදී ඇත්නම් හැකි ඉක්මනින් Centrelink අමතන්න. ප්‍රාන්ත හා ප්‍රාදේශීය රජයන් පවත්වාගෙන යන ඉඩකඩම් පිළිබඳ ලියාපදිංචි ලේඛන සමග ග්‍රාහක තොරතුරු සංසන්දනය මේ දිනවල කෙරෙනු ලැබේ. දේපල හිමි බව මේ වන විටත් දන්වා නොමැති පාරිභෝගිකයන්ගෙන් ඒ පිළිබඳව නියම තත්වය විමසා දීමනාව නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. කුමන පාරිභෝගිකයා දේපල හිමිකම් දරයි ද සහ එය Centrelink වෙත දැනුම් දී ඇත්දැයි යන්න මේ තොරතුරු හෙලිදරව් කරනු ඇත. ඔබට හෝ ඔබේ සහකරු සහකාරිය සතු දේපලක් හඳුනාගනී නම් සහ එය ඔබේ ලිපිගොනුවේ දැනට ලියාපදිංචි වී නැති නම් මෙකී හිමිකම් තහවුරු කිරීම සඳහා Centrelink ඔබ ඇමතීමට ඉඩ ඇති අතර ඔබ නිවැරදි ගෙවීම් ලබන බවටද සහතික වනු ඇත. ඔබට වැඩිපුර මුදල් ගෙවා ඇත්නම් ඔබේ ගෙවීම් අඩුවිය හැකි සහ / හෝ ඔබට නැවත මුදල් ගෙවීමට සිදුවනු ඇත. වැඩිපුර ගෙවනු ලැබ ඇත්නම් දීමනාව අඩුවෙන් ලබා ගැනීමට හෝ සහ මුදල් ආපසු ගෙවීමට හෝ ඔබට සිදුවනු ඇත. හිමිකම් නිගමනය සමග ඔබට එකග විය නොහැකි නම් එම නිගමනය නැවත සලකා බලන මෙන් ඉල්ලා සිටිය හැක.

Centrelink ප්‍රාන්ත හෝ ප්‍රාදේශීය රජයයන්ට ඉහත තොරතුරු කිසිවක් හෙලිදරව් නොකරයි.

සිංහල භාෂාවෙන් අංක **13 1202*** ඇමතීමෙන් හා **www.centrelink.gov.au** යන වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් වැඩිදුර විස්තර ලබාගත හැක.

* සම්මත දුරකථන සේවාවක් මගින් ඔස්ට්‍රේලියාව ඇතුලත ඕනෑම ස්ථානයක සිට අංක "13" න් පටන් ගන්නා දුරකථන අංකයන් සඳහා ප්‍රාදේශීය ඇමතුම් ගාස්තුවකට වැඩි නොවන මිලකින් ඇමතිය හැකිය. (දුරකථන ගාස්තු අයකිරීම් දුරකථන සේවාදායකයා අනුව වෙනස් විය හැකිය). අංක "1800" න් පටන් ගන්නා දුරකථන අංක ගාස්තු වලින් නිදහස්ය. පොදු හෝ ජංගම දුරකථන වලින් කෙරෙන ඇමතුම් සඳහා වැඩි මුදලක් අය කෙරෙනු ඇත.